නැවත චීනයට ප්‍රේෂණයවීමයි. ලංකාවේ අපනයනයන්ගෙන් 60%ක් මිලදී ගන්නේ යුරෝපය හා ඇමරිකාවයි. ලංකාව චීනයෙන් ආනයනය කරන ප්‍රමාණය අපනයනය මෙන් 16 ගුණයකි. ආනයනය ඩොලර් මිලියන 3955 වනවිට අපනයනය ඩොලර් මිලියන 247කි. චීනයෙන් ලබාගත් ණය පියවීමට සිදුවී ඇත්තේ විශ්‍රාමික ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ මගිනි. ඉදිරි දශකය තුළ චීනය සමග පවත්වන වෙළෙඳ සබඳතා තුළින් වැඩි වාසියක් අත්වන්නේ චීනයටය. පසුගිය දශකය තුළ චීන අයෝජන ඉදිකළ ඉදිකිරීම් හැරෙන්නට විරැකියා ප්‍රශ්නයට පිළිතුරක් ලැබී නැත. විරැකියා ප්‍රශ්නයට විසඳුමක් ලැබුණි නම් ලක්ෂ 20ට ආසන්න විශ්‍රාමික ශ්‍රමිකයන් සිටීමට ඉඩක් නැත.
පසුගිය අවුරුදු කිහිපය තුළම ප්‍රධාන විනිමය උපයන මාර්ගය වූයේද ඉහත කී විශ්‍රාමික ශ්‍රමිකයෝය. ලංකාවේ වෙළෙඳාම පාළ නිර්මාණය කරගත යුතුවන්නේ චීනයේ නොව යුරෝපයේ හා ඇමරිකාව තුළය.

අනෙක් කරුණ සියලූ ජන කොටස් සාමකාමී දිවිපෙවෙතක් ගතකිරීමට අවශ්‍ය අවකාශයක් ඇති කිරීමය. ඒ සම්බන්ධව තීරණය කිරීමට තිබුණේ 2009 වසරේදීය. උතුරු නැගෙනහිර ජන ජීවිතයට බලපාන මානුෂික ගැටලූ විසඳීමට වඩා අවධානය යොමුවී තිබුණේ ඉදිකිරීම් වෙනුවෙනි. 2010 2014 උතුරු නැගෙනහිර පැවතියේ කඳවුරු රාජ්‍යයකි. සිවිල් පරිපාලනය ස්ථාපිත කොට දමිළ ජනතාවගේ ඉඩම් ලබාදී චෝදනා රහිතව සිටි රැඳවියන් නිදහස් කර ඔවුන්ට මේ රටේ පුරවැසියන් යන අභිමානය ලබාදීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස ජන කණ්ඩායම් අතර ඇතිවූ දුරස්ථභාවය සමනය කිරීම දැනටත් අර්බුදයක්ව ඇත.

ගෝඨාභය මහතා සඳහන් කළ වංචා දූෂණ සම්බන්ධ කාරණයේදී පසුගිය දශක 4න් වඩාත්ම දූෂිත දශකය වන්නේ 20052015 කාලපරිච්ඡේදය (මෙයින් අනෙක් දශක 3 දූෂණ නොවූ බවක් අදහස් නොවේ.) 2005-2015 කාලපරිච්ඡේදය තුළ දූෂණ නිසා රටට අහිමි වූ මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 3%ක් ඉක්මවන බව සාමාන්‍ය පිළිගැනීම වෙයි. මූල්‍ය විනය සම්පූර්ණයෙන් පිරිහී තිබුණි. විගණකාධිපතිවරයා වරක් ප්‍රකාශ කර තිබුණේ 20052015 කාලය තුළ ලබා ගත් ණය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ලබාගැනීමත් අපහසු බවය. රටේ පැවති සමාගම්වලට කළ බලපෑම් අදාළ ආයතන නිලධාරීන්ගෙන් දැනගත හැකිය. 2014 වන විට මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටි කොන්ත්‍රාත්කරුවන්ට විශාල බලපෑමක් එල්ල වී තිබුණි. අද වියත්මග සංවිධානයේ ප්‍රධාන දේශකයකු වන හිටපු විනිමය කොමිෂන් සභාවේ සභාපති නාලක ගොඩහේවා මහතාට විනිමය කොමිෂන් සභාවේ සිදුවූ අක්‍රමිකතා සම්බන්ධ නඩුවක්ද ඇත. අද වියතුන් ලෙස පසුගිය ආණ්ඩුවේ කොටස්කරුවන් වූ මේ පිරිසට අවම වශයෙන් ලෝකයේ බොහෝ රටවල් ක්‍රියාත්මක කරන රාජ්‍ය ආදායම්, ගිය වියදම් හා ආයෝජන සමතුලිතතාව පවත්වා ගැනීමට නොහැකි විය. ඉතිරි කර තිබුණේ ණයගැතිභාවය හා වේගයෙන් අඩුවන රාජ්‍ය ආදායම් සහිත තත්ත්වයන්ය. මේ බොහෝ වියතුන් පසුගිය අවුරුදු 10 තුළම කටයුතු කළේ රාජ්‍ය අරමුදල් දේශපාලන බලය රැකගැනීම වෙනුවෙන් යෙදවීමය. බොරු වියතුන් වෙනුවට සැබෑ වියතුන් එළියට ඒම අවශ්‍ය වී ඇත. එසේ නොවුණහොත් සිදුවන්නේ දෙවියන් නොමැති තැන මෝඩයන් පිනුම් ගසන තත්ත්වයක් ඇතිවීමය.

**රාවය**



# වනබිම සැරිසර



## නිමල් සේදර

# මිනී මරා මන්තරයට කොටු වූ ඇසළයා

**"ඇසළයා ඇත්ගොව්වා මරා අතුකොළවලින් වසා දැමුවේය. එතැන සිට සැතපුම් කාලක පමණ දුරින් පිහිටි වැඩබිමට ගිය ඇසළයා එතැන තිබුණු වාඩිය විනාශ කර ලොරි දෙකකටත් පහර දුන්නේය. යළිත් ඇත්ගොව්වාගේ මළසිරුර තිබූ ස්ථානයට ගොස් ලේ පෙරෙන මළසිරුර වාඩියට ගෙනාවේය. එවර එතැන ගස් බැඳ සිටි තම වර්ගයේ එකෙකුටද පහර දී ඇසළයා යළිත් මළ සිරුර රැගෙන ගියේ මුල් පහර දීම සිදු වූ ස්ථානයටමය."**

වනන්තරේ සිටින අලි ඇතුන් අල්ලා හීලෑ කර වැඩ ගන්නට මිනිසා හපන් වුවත් ඒ සද්ධන්ත සිරුරු හෙන්ඩුවට අකීකරු වන අවස්ථාවන් එමට ඇත්තේය. අනුපමේය කාය ශක්තියකින් හෙබි හස්තිස්තිරාජයාගෙ පිට උඩ නැගගෙන යන විටත් උගේ හිස අද්දරින් බිම ගමන් කරන විටත් අවධානම් ඒකාකාරවම ඇත්තේය. මේ ලිපියෙන් අප කතා කරන්නේත් ඇත්ගොව්වෙකුට මුහුණ පෑමට වූ ඛේදජනක ඉරණම පිළිබඳවයි.

වැල්ලවාය පැත්තේ ලී කොන්ත්‍රාත් ලබාගන්නා මුදලාලිලා අලි ඇතුන් ගෙන ගොස් දැවැන්ත කොට පෙරලීම එසවීම පැටවීම යන කරුණු ඉටු කරගනිති. මට මේ රසවත් ත්‍රාසජනක අලි කතා කියූ අත්තනගල්ලේ අයියාද එසේ මීට වසර ගණනකට පෙර ඇත්ගොව්වෙකු ලෙස විසි වසරක් සේවය කළ තැනැත්තෙකි. මෙසේ ලී පැටවීම, බෑම පෙරළීම යන කටයුතු සඳහා කොළඹින් වැල්ලවාය පෙදෙසට ගෙන ගිය අලීන් අතර අත්තනගල්ලේ අයියාගේ අලියාද වැරදුනේ නැත.

මෙසේ කොළඹ අවටින් වැල්ලවායට ගෙනයන අලි කොටන් පැටවීම කොපමණ කල් එකදිගට කළාදැයි මම ප්‍රශ්න කළෙමි. උත්තර පුදුමාකාර වූ අතර හද කම්පා කරන සුළු විය.

“අලි කෙට්ටුවෙනකල් වැඩ ගන්නවා.” පිළිතුර එසේ විය. අලියා වැඩෙන් හෙම්බත් වී කෙට්ටුවීමට කොපමණ කල් යන්නේද ? අලියාට වැඩපලවලින් තෙහෙට්ටුව දැනෙන්නට වසර දෙකක් හෝ තුනක් යයි. එතෙක් එකදිගටම සුදුසු පරිදි වැඩට යොදා ගන්නවා. එදා ලී කොන්ත්‍රාත් සඳහා රැගෙන ගිය අලි ඇතුන් වැඩට යෙදුවේ මේ ආකාරයටය. මෙසේ කොන්ත්‍රාත් වැඩට යන කළ අලි හතර පස් දෙනෙකුම ගෙන යාම සාමාන්‍ය සිරිතය.

“කොළඹ ගුණේසිරි රාළහාමිගේ අලියා “ ඇසළයා” ද මෙසේ ලී පටවන්නට ගිය අලි රංචුවට අයත් විය. ඇසළයා බැලූ ඇත්ගොව්වාගේ නම සිරිසේන විය. එදා දහවල වනතුරු අලින්ගෙන් වැඩගත් අතර ඉර මුදුන් වූ පසු ඔවුහු විවේක ගන්නට දියට බස්සවනු ලැබූහ. බොහෝ වේලාවක් සිත් සේ දියේ දිග හැරී සිටි අලීන් ආපසු කණුවට ගෙන යන වේලාව ලඟා විය. සිරිසේනද ඇසළයා දියෙන් ගොඩට ගත්තේය. දියේ දිගාවූ පසු නැගිටීමට අලියා එතරම් කැමැත්තක් නැත. දියේ සිට ගිනියම නිවා ගැනීමට ඔවුහු කැමතිය.”

අලියෙන් දියෙන් ගොඩට ගෙන මහ පාරට දමා වැඩි දුරක් යන්නට පෙර බයිසිකලයක නැගගත් මගියෙකු ඉදිරියට ආවේය. කිසියම් කේන්තියකින් පෙලෙන බවක් පෙන්වූ “ ඇසළයා” හොඬය දිගු කළේ බයිසිකල් කාරයා ඔසවා පොළවේ ගැසීමටය. සිදුවන්නට යන දේ වළක්වන්නට සිරිසේනට ඇත්තේ තත්පර කිහිපයක වේලාවක. සිරිසේන හෙන්ඩුවෙන් ඇන්නේය. බයිසකල් කරු අනූනවයෙන් බේරී පලාගිය නමුත් ඒ කේන්තියත් වේදනාවත් පිරිමහින්නට ඇසළයාට ඉතිරි වූයේ සිරිසේනය. ඇසළයා කෝපයෙන් වියරු වී මහ හඬින් කෑගසා තමා මෙතෙක් කල් බලාගත් ඇත්ගොව්වා වූ සිරිසේන එක මොහොතකින් ඔසවා ගත්තේය. හොඬේ දැවටුන සිරිසේන දන්න ශිල්ප ක්‍රම යොදා පණ බේරාගන්නට බැලුවත් නොහැකි විය. ඈතට විසිකර එතනට පියවර මැන එල්ල කල පහරත් සමඟම සිරිසේනගේ විලාප හඬද නිමවිය.

කම්පනයට පත් වූ ඇසලයා මහා හඬින් කෑ ගසා පොළව පහුරු ගාමින් සිය මියගිය හිතවතා වෙත ටික වේලාවක් රැඳී සිටියේය. කිසිවෙකුටත් ඇසලයා වෙත කිට්ටුවන්නට ශක්තියක් නැත. කවුරුත් තැතිගෙන බලා සිටිති. ටික වේලාවක් සිරිසේනගේ මලසිරුර අසල රැඳී සිටි ඇසළයා එම සිරුර හොඬයේ දවටා ඔසවා ගත්තේය. සුපුරුදු වාඩිය වෙත පැමිණි ඇසළයාගේ උමතු ගතිය වැඩිවිය. ඇතැම් විට උගට සිරිසේන නැති පාඩුව හා පාළුව වැඩි වැඩියෙන් දැනෙන්නට විය.

වාඩිය අසල නතර කරතිබුණු ලොරි



දෙකකට ඇසළයා පහර දුන්නේය. ලී වැඩට පැමිණි අය නවාතැන් ගෙන සිටි වාඩි විනාශ කර දැම්මේය. මේ අලාභය සිදු කරද්දී ඇසළයා හැසුරුණේ දැඩි කම්පනයකින. උගු මහා හඬින් කෑ ගැසුවේය.
සිදුවන්නට යන්නේ කුමක්දැයි අදහා ගත නොහැකිව සිටියදී “ ඇසළයා” ඝාතනය කිරීමට ඇතැමුන් කතාබහ වෙද්දී උගු නොසිතූ පියවවරක් ගත්තේය. වාඩියේ සිට යලිත් ස්වාමියා ඝාතනය කළ ස්ථානය දක්වා ඇසළයා ලැසි ගමණින් ගියේය. ඒ යන ගම පෙත දෙසට ගිය ඇසළයා ඇත්ගොව්වාගේ සිරුර පසෙක තැම්පත් කර කොළ අතු කඩා සිරුර වසා දැමුවේය. ඇතැම්විට ඒ මොහොතේ ඒ තිරිසන් සතාට සිය මිත්‍රයාට දක්වන්නට හැකි උපරිම ගෞවරය එය වන්නට තිබිණි. සිරුර අතුකොළ වලින් වසා බොහෝ වේලාවක් එතැන රැඳුන ඇසළයා පාරදිගේ හදුකලාවම සුපුරුදු වාඩිය කරා පියවර මැන්නේය.

පාර දෙපැත්තේ සිටියෝ සී සී කඩ දිවූහ. ගොව්වකු නැති අලියෙක් මිනී මැරූ අලියෙක් දැන් නිදහසේ මඟ සැරසරයි. ලැසි ගමනේදි කිසිවකුටත් හානි නොකර අතර ශෝකාත්මික හඬක් විලාප නගන්නාක් මෙන් නුහුරු හඬක් මතු කරමින් ඉදිරියට ගියේය. වැඩි වේලාවක් යන්නට පෙර ඇසළයා යලිත් ඇත්ගොව්වාගේ මළකඳ වෙත පැමිණියේය. ඇසළයා එනු දැක මළකඳ අසල සිටියෝ හිස් ලූ ලූ අත දිවූහ.

සිරිසේනගේ ලේ පෙරෙන මළ සිරුර දෙස ඇසළයා මෙවර බැලුවේ පෙරටත් වැඩි කම්පයකිනි. එක දිගට බොහෝ වේල්වක් කුංචනාද කළ ඇසළයා ක්ෂණික තීරණයක් ගනිමින් මළ සිරුර හොඬවැලේ දවටා

22 වන පිටට

## රාජකීය විවාහය සලිත කළ කළු ජාතික ඇමෙරිකානු බිෂොප්වරයා ...



**සරෝජ් පතිරණ.**

බ්‍රිතාන්‍යයේ ඔටුන්න හිමි චාල්ස් කුමරුගේ දෙවෙනි පුත් හැරී කුමරු සහ අප්‍රිකානු සම්භවයකින් යුත් ඇමෙරිකානු කාන්තාව කගේ දියණිය වන මෙගන් මාකල් අතර විවාහ මංගල්‍යය ගැන බොහෝ දෙනා විවිධ කෝණවලින් අදහස් පළ කරනු පෙනේ.

ඇයගේ පියාට මංගල උත්සවයට සහභාගි වීමට නොහැකිවීම සතියකට අධික කාලයක් මුළුල්ලේ බ්‍රිතාන්‍ය මාධ්‍යවල මුල් පුවත බවට පත්ව තිබිණ.

ඒ අතරම මෙගන්ගේ ඥාති සොහොයුරිය සහ ඥාති සොහොයුරා ඇය සම්බන්ධයෙන් දැක්වූ අනුකම්පා විරහිත ආකල්පය ද ඔවුන්ට තවත් ප්‍රධාන මාතෘකාවක් විය.

විවාහයෙන් අනතුරුව දැන් බ්‍රිතාන්‍ය මාධ්‍යවල ප්‍රධාන පුවත මෙගන්ගේ මංගල සාරිය, උත්සවයෙන් අනතුරුව පැවති සාදය සහ ඔවුන් දෙදෙනා කොතැනක මධු සමය ගත කරනු ඇත්ද යන්න වැනි ඕපා දූප ගැනය.

මෙගන්ගේ ආරාධනයෙන් උත්සවයට පැමිණ, ලබා දුන් විනාඩි 5 වෙනුවට විනාඩි 14ක්ම ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ජනතාව පින වූ ඇමෙරිකානු පූජක මයිකල් කරී (Michael Curry) රදගුරුවරයා ගැන සමාජ මාධ්‍ය ජාල ප්‍රබල අවධානයක් යොමු කළත්, එය ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල එතරම් අවධානයට ලක් වූ හැඩක් නොපෙනේ.

එතෙක් අතිශය ගරු ගාම්භීර බවක් (solemn ) ඉසිලූ රාජකීය විවාහ උත්සවයේ සියලූ සම්ප්‍රදායයන් බිඳ දමමින් ඔහු එයට විනෝදාස්වාදයක් එක් කළා පමණක් නොව සිය සුමියුරු වාග් චාතුර්යය යොදා ගනිමින් ඔහු සමස්ත ලෝකවාසීන් වෙත තිලින කළේ සුවිශේෂී පණිවුඩයකි.

ආචාර්ය මාටින් ලූතර් කිං උපුටා දක්වමින් ප්‍රමයේ ශක්තිය ගැන ඉතා බලගතු දේශනයක් පැවැත්වූ රදගුරු මයිකල් කරී, ප්‍රේමය රජයන්නේ නම් ලෝකය ක්ෂේම භූමියක් වනු ඇතැයි පැවසීය.

(When love is the way poverty will become history. When love is the way the Earth will be a sanctuary)

ආගම අබිං බව කියමින් පිළිකෙව් කළ මාක්ස් සහ එංගල්ස් වැනි වාමාංශිකයන් පවා එවැනි දේශනයකින් වශී වනු ඇතැයි මට සිතේ.

රදගුරු මයිකල් කරී එලිසබෙත් රැජින සහ රාජකීයයන් ඇතුළු සමස්ත ආරාධිත පිරිස ආමන්ත්‍රණය කළේ ද “සහෝදර, සහෝදරියනි” යනුවෙනි.

ඔහුගේ දේශනයේ අන්තර්ගතය පමණක් නොව ඔහු එය ඉදිරිපත් කළ ආකාරය ද සුවිශේෂී වූවකි.

20 වන පිටට